# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2011/10 - 2017 මාර්තු මස 21 වැනි අඟහරුවාදා - 2017.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2017 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2013 ජුනි මස 05 වැනි දිනැති අංක 1813/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එහි කලින්කලට සංශෝධනය කරන ලද ගැසට් පත්‍රයන්හි පළ කරන ලද විශේෂ ආනයන බලපත්‍ර නියෝගයන්හි අංක 1 දරන උපලේඛනයට මෙහි පහත සඳහන් I සහ II වන තීරයේ දැක්වෙන, අයිතමවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සහ III වන තීරයේ දැක්වෙන, ඊට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| (I) *තීරය ශීර්ෂ අංකය* | (II) *තීරය සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය* | | (III) *තීරය විස්තරය* | ICL |
|---|---|---|---|---|
| 87.05 | | | ප්‍රධාන වශයෙන් පුද්ගලයන් හෝ බඩු ප්‍රවාහනය සඳහා සැලසුම් කරන ලද ඒවා හැර, විශේෂ කාර්යය මෝටර් වාහන (උදාහරණ වශයෙන්, ආපදා ලොරි, දොඹකර ලොරි, ගිනි නිවීමේ වාහන, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ ලොරි, මාර්ග අතුගෑමේ ලොරි, ඉසීමේ ලොරි, ජංගම වැඩපළ, ජංගම රශ්මි විද්‍යා ඒකක). | |
| | 8705.90 | - | අනෙකුත් ඃ | |
| | | --- | කොන්ක්‍රීට් පොම්ප ට්‍රක් රථ | |
| | 8705.90.32 | ---- | අවුරුදු දහයකට වඩා පැරණි | L |

04 - 41

1A - PG 3456 — 607 (2017/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*